# 8. රූටයිල්වලින් $TiO_2$ (ටයිටේනියම් ඩයොක්සයිඩ්) නිපදවීම

ටයිටේනියම් අන්තර්ගත ප්‍රධාන ඛනිජ වර්ග ලෙස ඉල්මනයිට් ($FeTiO_3$) හා රූටයිල් ($TiO_2$) දැක්විය හැකි ය. ටයිටේනියම් ලෝහය $TiO_2$ ස්වරූපයෙන් බහුලව පවතින ඛනිජය රූටයිල් ය. ඉල්මනයිට් යනු $TiO_2$ හා $FeO$ ඔක්සයිඩ් දෙකෙහි මිශ්‍රණයකි. ඉල්මනයිට් භාවිත කරමින් $TiO_2$ නිෂ්පාදනය කරන අවස්ථාවල දී පළමුව එහි වූ $FeO$ ඉවත් කිරීම සිදු කරයි. එමගින් $TiO_2$ ප්‍රතිශතය වැඩි කිරීම සිදු වේ. ඉල්මනයිට්වලින් $FeO$ ඉවත් කිරීම සල්ෆේට් ක්‍රියාවලිය (sulphate process) ලෙස හඳුන්වයි.

ඉල්මනයිට් හි $FeO$ ඉවත් කරමින් $TiO_2$ ප්‍රතිශතය 70% වඩා වැඩි අවස්ථාවට පත් කළ පසු එමගින් සංශුද්ධතාව ඉතා ඉහළ $TiO_2$ නිෂ්පාදනය කරනු ලබයි. ඉල්මනයිට්වලින් ආරම්භ කර $TiO_2$ ප්‍රතිශතය 70% ඉක්මවූ අවස්ථාවක් දක්වා පිරිපහදු කිරීමෙන් පසුව හෝ රූටයිල් භාවිත කිරීම මගින් සංශුද්ධතාව ඉතා ඉහළ $TiO_2$ නිෂ්පාදනය කළ හැකි ය.

ඒ නිෂ්පාදන ක්‍රියාවලිය **ක්ලෝරයිඩ් ක්‍රියාවලිය** ලෙස හඳුන්වනු ලැබේ.

## රූටයිල් මගින් $TiO_2$ නිෂ්පාදනය ආශ්‍රිත රසායනික ක්‍රියාවලිය (ක්ලෝරයිඩ් ක්‍රියාවලිය)

රූටයිල්හි වූ විවිධ අකාබනික අපද්‍රව්‍ය ඉවත් කර සංශුද්ධතාව ඉහළ TiO2 නිපදවීම මෙහි අරමුණ වේ. එහි වූ පියවර දෙකකි.

**1) ක්ලෝරිනීකරණය**

**2) ඔක්සිකරණය**

මෙහිදී, අමුද්‍රව්‍ය ලෙස අසංශුද්ධ රූටයිල් හා කෝක් (C) භාවිතා කරයි.

### 1) ක්ලෝරිනීකරණය

- රූටයිල් හා කෝක් (C) හි වූ තෙතමනය ඉවත් කිරීම පිණිස වියළීම ඉතා අවශ්‍ය වේ. මේ නිසා 200 °C - 300 °C වැනි උෂ්ණත්වයකට රත් කර හොඳින් වියළීම කරනු ලබයි.
- ක්ලෝරිනීකරණ ක්‍රියාවලිය සඳහා රූටයිල් හා කෝක් සහිත මිශ්‍රණය 950 °C පමණ වූ උෂ්ණත්වයට රත් කරනු ලබයි.
- ඒ මතින් $Cl_2$ වායු ධාරාවක් යවනු ලැබේ.
    - එහි දී කෝක් හමුවේ $TiO_2$ සමග $Cl_2$ ප්‍රතික්‍රියාවෙන් $TiCl_4$ වායුව ප්‍රතිඵල ලෙස ලැබේ.
    - මේ ප්‍රතික්‍රියාව තාපදායක ය.
    - එයට ප්‍රධාන හේතුව කෝක් ඔක්සිකරණය වී $CO_2$ බවට පත් වීමයි.
      ඒ ප්‍රතික්‍රියා පහත පරිදි දැක්විය හැකි ය.

      $$TiO_{2(s)} + C_{(s)} \longrightarrow Ti_{(s)} + CO_{2(g)}$$

      $$Ti_{(s)} + 2Cl_{2(g)} \longrightarrow TiCl_{4(g)}$$

      මේ සමස්ත ප්‍රතික්‍රියාව පහත පරිදි දැක්විය හැකි ය.

      $$TiO_{2(s)} + C_{(s)} + 2Cl_{2(g)} \xrightarrow{950\ ^\circ C} TiCl_{4(g)} + CO_{2(g)}$$

    - $TiCl_4$ හි තාපාංකය 134 °C වේ.
    - ඒ නිසා ප්‍රතික්‍රියා කුටීරයෙන් ඉවතට එන වායු මිශ්‍රණයේ ප්‍රධාන වශයෙන් $TiCl_4$ හා $CO_2$ ඇත.
    - මීට අමතරව ඇතැම් අතුරු ප්‍රතික්‍රියාහි ප්‍රතිඵලයක් ලෙස HCl හා CO වායු මෙන් ම දූවිලි අංශු පැවතිය හැකි ය.
    - එබැවින් $TiO_2$ ආශ්‍රිතව තිබුණු අකාබනික අපද්‍රව්‍ය වෙන් වීම මෙහි දී සිදු වේ.
    - දූවිලි අංශුන් ඉවත් කිරීමෙන් පසු ඒ වායු මිශ්‍රණය සිසිල් කිරීමෙන් ද්‍රව $TiCl_4$ වෙන් කර ගනු ලැබේ.
    - එසේ වෙන් කර ගත් ද්‍රව $TiCl_4$ තවදුරටත් සංශුද්ධ කිරීමෙන් පසු ඔක්සිකරණය කරනු ලබයි.

**2) ඔක්සිකරණය**

- පළමු පියවරේ ප්‍රතිඵලය වූ $TiCl_4$ සමඟ $O_2$ ප්‍රතික්‍රියා කිරීමට සලස්වා නැවත $TiO_2$ ජනනය කිරීම මෙහි දී සිදු වේ.
- මේ නිසා රූටයිල්හි වූ අකාබනික අපද්‍රව්‍යවලින් තොර සංශුද්ධ $TiO_2$ නිපදවීමට මේ ක්‍රියාවලිය වැදගත් වේ.
- එහි දී ප්‍රතිඵල වන $Cl_2$ වායුව නැවත ක්ලෝරිනීකරණයට භාවිත කරයි.
- එනිසා මෙහි දී $Cl_2$ වායුව ප්‍රතිචක්‍රීකරණය වේ.

$$TiCl_{4(g)} + O_{2(g)} \xrightarrow{1000\ ^{o}C} TiO_{2(s)} + 2Cl_{2(g)}$$




**TiO2 නිෂ්පාදන ක්‍රියාවලිය**

- මේ ක්‍රියාවලිය මඟින් කෝක් ඔක්සිකරණය වී වායුගෝලයට $CO_2$ එක් කිරීම සිදු වේ.
- එනිසා ක්ලෝරයිඩ් ක්‍රියාවලිය මඟින් ගෝලීය උණුසුම වැඩි කිරීමට යම් දායකත්වයක් සැපයේ.

(2006 වසරේ දී මේ කර්මාන්ත මඟින් වායුගෝලයට මුදාහරින ලද සමස්ත $CO_2$ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 3.6කි. මේ ප්‍රමාණයෙන් අඩක් උෂ්ණත්වය ජනනය සඳහා වූ ඉන්ධන දහනය නිසා ද ඉතිරි ප්‍රමාණය නිෂ්පාදන ක්‍රියාවලිය නිසා ද ජනනය වී ඇත.)

## $TiO_2$හි ප්‍රයෝජන

1) $TiO_2$ සුදු පැහැතිය. ඒ නිසා තීන්ත, ප්ලාස්ටික් භාණ්ඩල කඩදාසි ආදියෙහි දීප්තිමත් සුදු වර්ණය ලබා ගැනීම සඳහා වර්ණකයක් ලෙස $TiO_2$ යොදා ගැනේ.
   $TiO_2$ සතුව ඉහළ වර්තනාංකයක් පැවතීම ද එම සංයෝගය වර්ණකයක් ලෙස යොදා ගැනීම හේතු වී ඇත.
2) රසායනිකව අක්‍රිය නිසා ඖෂධ හා දන්තාලේපවල සුදු වර්ණය ලබා දෙන පිණිස වර්ණක ලෙස $TiO_2$ භාවිත කරයි.
3) සූර්ය කිරණවල අඩංගු වූ පාරජම්බුල කිරණ නිසා සමේ පිලිස්සීම් ඇති වීම වැළැක්වීමට ආලේප කරන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ද $TiO_2$ භාවිත කරයි. $TiO_2$ මගින් UV කිරණ සම කරා ලඟා වීම වලකනු ලබයි.
4) ඇතැම් සූර්යකෝෂ නිෂ්පාදනයට $TiO_2$ යොදා ගනු ලබයි.